025

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 07 - ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

නම/විභාග අංකය :- ........................................................................ කාලය: පැය 02 යි.

I කොටස

පියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

* **අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) බුදුරජාණන් වහන්සේ සත්සතිය ගත කරන අතරතුර අභිධර්මය මෙනෙහි කළහ. එහිදී බුද්ධ ශරීරයෙන් බුදුරැස් විහිදෙන්නට විය. එය සිදු වූයේ,

(1) පළමු සතියේ දී ය. (2) සිව්වන සතියේ දී ය. (3) පස්වන සතියේ දී ය. (4) හයවන සතියේ දී ය.

(02) බිම්බිසාර රජතුමා විසින් බුදු සසුනට පූජා කළ ආරාමය වූයේ,

(1) වේළුවනාරාමය (2) ඝෝෂිතාරාමය (3) නිග්‍රෝධාරාමය (4) පූර්වාරාමය

(03) "යහපත් කොට ගෙතැයි , සුන්දර තැනට සැපතැයි..." යනාදී ලෙස බුදුගුණ අලංකාරයෙහි සඳහන් පදයෙන් හඳුන්වන බුදු ගුණය වන්නේ,

(1) අරහං බුදු ගුණයයි. (2) ලෝකවිදූ බුදු ගුණයයි.
(3) සුගත බුදු ගුණයයි. (4) භගවා බුදු ගුණයයි.

(04) දුරුතු මස පුර පසළොස්වක පොහෝ දිනක බුදුරජාණන් වහන්සේ ලක්දිවට වැඩම කළ ස්ථානය වන්නේ,

(1) දිවාගුහාව (2) නාගදීපය (3) කැළණිය (4) මහියංගණය

(05) ධම්ම පදය නම් කෘතිය අයත් වන්නේ සූත්‍ර පිටකයේ,

(1) ඛුද්දක නිකායට (2) දීඝ නිකායට (3) සංයුක්ත නිකායට (4) අංගුත්තර නිකායට

(06) ජීවිත හානි කිරීමෙන් වැළකීම, දඬු මුගුරු අවි ආයුධ බැහැර කිරීම ආදිය අයත් වන්නේ,

(1) සමාදානයට ය. (2) චාරිත්‍රවලට ය. (3) ත්‍රිකෝටි පාරිශුද්ධියට ය. (4) විරතියට ය.

(07) සිගාලෝවාද සූත්‍රයට අනුව ගුරුවරු විසින් ශිෂ්‍යයාට ඉටු කළ යුතු යුතුකමක් නොවන්නේ,

(1) රැකවරණය සැලසීම (2) යහළු මිත්‍රාදීන්ට හඳුන්වා දීම
(3) අවශ්‍ය කටයුතු සිදුකර දීම (4) හොඳින් ඉගැන්වීම

(08) ඉවසීමේ ගුණයට ආදර්ශවත් චරිතයක් ලෙස බුදුරජාණන් වහන්සේ අගය කරනු ලැබුවේ,

(1) ආනන්ද තෙරුන් වහන්සේ ය. (2) රාහුල තෙරුන් වහන්සේ ය.
(3) මුගලන් තෙරුන් වහන්සේ ය. (4) පුණ්ණ තෙරුන් වහන්සේ ය.

(09) අතීතයේ 'අක්කිපාල' වෙන් කිරීම පනුවෙන් අදහස් කරනුයේ,

(1) මුල්ම අස්වැන්නෙන් බුදුරදුන්ට පුදන කොටස වෙන්කිරීමයි.

(2) මුල්ම අස්වැන්නෙන් දෙවියන්ට පුදන කොටස වෙන්කිරීමයි.

(3) මුල්ම අස්වැන්නෙන් මහ සඟරුවන සඳහා වෙන් කිරීමයි.

(4) මුල්ම අස්වැන්නෙන් වැඩිහිටියන් සඳහා වෙන් කිරීමයි.

(10) සාලිකේදාර ජාතකයෙන් කියවෙන්නේ,

(1) අසරණ දෙමාපියන්ට හොඳින් සැලකූ කුරුලු පැටවකු පිළිබඳවයි.

(2) බුද්ධිමත් වෙළඳ නායකයකු පිළිබඳවයි.

(3) යහපත් මිතුරන් ඇසුරු කළ පුද්ගලයකු පිළිබඳවයි.

(4) තමාට උපකාර කළ හිවලාට කළගුණ සැලකූ සිංහයාගේ කතාව පිළිබඳවයි.

(11) උරුවෙල් දනව්වේ දී බුදුරජාණන් වහන්සේ වෙතින් පැවිදිව බුදු සසුනට ඇතුළත් වූයේ,

(1) යසකුල පුත්‍රයා ඇතුළු පිරිසයි. (2) තුන් බෑ ජටිලයන් ය.

(3) පස්වග තවුසන් ය. (4) භද්දවග්ගිය කුමාරවරු ය.

(12) සැරියුත් මහරහතන් වහන්සේට හිමිවූ තනතුරක් වන්නේ,

(1) ධර්ම සේනාධිපති තනතුර (2) ධර්ම භාණ්ඩාගාරික තනතුර

(3) ධුතාංගධාරීන් අතර අග තනතුර (4) ශික්ෂාකාමීන් අතර අග තනතුර

(13) විවිධ රෝගාබාධ සුවගන්නා ක්‍රම පිළිබඳව කරුණු ඇතුළත් සූත්‍ර දේශනාවක් වන්නේ,

(1) තිරෝකුඩ්ඩ සූත්‍රය (2) සිඟාලෝවාද සූත්‍රය

(3) රතන සූත්‍රය (4) ගිරිමානන්ද සූත්‍රය

(14) සතර සතිපට්ඨානයට අයත් නොවන්නකි.

(1) කායානුපස්සනාව (2) ධම්මානුපස්සනාව

(3) බුද්ධානුපස්සනාව (4) චිත්තානුපස්සනාව

(15) බුදුරජාණන් වහන්සේ විසින් පැවැත්වූ පළමු ධර්ම දේශනාව වන්නේ,

(1) කාලාම සූත්‍රය (2) දම්සක් පැවතුම් සූත්‍රය

(3) බ්‍රහ්මජාල සූත්‍රය (4) ආදිත්තපරියාය සූත්‍රය

(16) බුදුදහමේ තුලාධාරීන පුද්ගලයන් ලෙස හඳුන්වා ඇත්තේ,

(1) සමජීවිකතාවෙන් යුතුව ජීවත්වන පුද්ගලයන් ය.

(2) නොසා නොමි ධනය උපයන පුද්ගලයන් ය.

(3) අපිරිමැස්මෙන් තොරව ධනය විනාශ කරන පුද්ගලයන් ය.

(4) ආය - වැය දෙක ගැන නොසිතා කටයුතු කරන පුද්ගලයන් ය.

17) මාතලේ අලු විහාරය ශාසන ඉතිහාසය තුළ වඩාත් වැදගත් වන්නේ,

(1) මිහිඳු මහ රහතන් වහන්සේ එහි වැඩ සිටි නිසා ය.

(2) දන්ත ධාතූන් වහන්සේ එහි වැඩ සිටි නිසා ය.

(3) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ නිසා ය.

(4) බුදුන් වහන්සේ තෙවන වරට වැඩම කළ ස්ථානය නිසා ය.

(18) සතර බඹ විහරණයන්ට අයත් වන්නේ,

(1) දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාවය

(2) මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා

(3) ඡන්දය, ද්වේෂය, භය, මෝහය

(4) දාන, සීල, භාවනා, පත්තිදාන

(19) විසි දහසක් මහ රහතන් වහන්සේලා පිරිවරා ගෙන බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩම කළේ,

(1) දුරුතු පුර පසළොස්වක පොහෝ දිනක ය.

(2) වෙසක් පුර පසළොස්වක පොහෝ දිනක ය.

(3) පොසොන් පුර පසළොස්වක පොහෝ දිනක ය.

(4) ඇසළ පුර පසළොස්වක පොහෝ දිනක ය.

(20) බුදු සසුනේ තෙරුවන් සරණ ගිය පළමු උපාසකයා බවට පත්වූයේ,

(1) බරණැස් සිටුතුමා ය. (2) යසකුල පුත්‍රයා ය.

(3) අනේපිඬු සිටුතුමා ය. (4) උපක ආජීවකයා ය.

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) පාසලේ පෙර පෝදා වැඩසටහන වෙනුවෙන් විශේෂ ධර්ම දේශනාවක් සඳහා වැඩම කළ ගරුතර ස්වාමීන් වහන්සේ ජීවිතය සරු කර ගැනීම සඳහා වැදගත්වන සිරිත් විරිත් පිළිබඳව කරුණු පැහැදිලි කළහ. එම කරුණු ඇසුරෙන් සකස් කරන ලද පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) සිරිත් විරිත් යන්නෙහි අර්ථය ලියන්න.

(ii) සිරිත් මල්දම හා කාව්‍යශේඛරය යන ග්‍රන්ථ දෙක රචනා කළ කතුවරු නම් කරන්න.

(iii) නිවසේ දී අනුගමනය කළ යුතු සිරිත් දෙකක් ලියන්න.

(iv) විනයගරුක දරුවකු ලෙස පාසලේ දී ඔබ අනුගමනය කරන සිරිත් දෙකක් ලියන්න.

(v) ඔබ පන්සලට ගොස් සම්බුද්ධ පූජාව පැවැත්වීමට පෙර අනුගමනය කරන යහපත් ක්‍රියා දෙකක් ලියන්න.

(ලකුණු 4 x 5 = 20)

(02) (i) පිරුවානා පොත් වහන්සේ තුළ අන්තර්ගත තුන් සූත්‍ර නම් කරන්න. (ලකුණු 02)

(ii) මෙත් වඩන්නකු තුළ තිබිය යුතු උසස් ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) මෛත්‍රිය වැඩීමෙන් සිදුවන සමාජයීය ප්‍රයෝජන පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (i) පංචශීලය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පන්සිල්වල ඇතුළත් මුල් සික්ඛාපද තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) පංච ශීලය ආරක්ෂා කිරීමෙන් ඇතිවන ප්‍රයෝජන පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) චතුරාර්ය සත්‍යය ඇතුළත් සූත්‍රය නම් කරන්න. (ලකුණු 02)

(ii) දුක්ඛ සමුදය ආර්ය සත්‍යයට අයත් තණ්හාවේ ප්‍රභේද තුන ලියන්න. (ලකුණු 03)

(iii) ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිවෙළින් ලියා එය ත්‍රිශික්ෂාවට බෙදා දක්වන්න. (ලකුණු 05)

(05) (i) සියල්ලෝ ම දඬුවමට බියවෙති. සියල්ලන්ට ම ජීවිතය ප්‍රිය ය. යන අදහස දක්වෙන ධම්මපද ගාථාව ලියන්න. (ලකුණු 02)

(ii) එහි තේරුම ලියන්න. (ලකුණු 03)

(iii) අධිපති ධර්ම තුන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) ත්‍රිවිධ චෛත්‍යය නම් කරන්න. (ලකුණු 02)

(ii) මිහිඳු මහරහතන් වහන්සේ සමග ලක්දිවට වැඩම කළ ධර්ම දූත කණ්ඩායමේ අනෙක් සාමාජික පිරිස නම් කරන්න. (ලකුණු 03)

(iii) මහින්දාගමනයෙන් පසු ලක්දිව දියුණු සංස්කෘතියක් ඇතිවූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) ගිලනුන්ට උපස්ථාන කිරීම (ලකුණු 05)

(ii) අනේපිඬු සිටුතුමා (ලකුණු 05)

(iii) නියාම ධර්ම (ලකුණු 05)

(iv) දස පුණ්‍ය ක්‍රියා (ලකුණු 05)